කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය-ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සකස් කළ ගුරුභවතාගේ නම - ඉෂාරා සේනාධීර

පාසල - ර/සීවලී මධ්‍ය විද්‍යාලය

ශ්‍රේණිය - 10

පාඩම - 1

# ව්‍යාපාර පසුබිම

මිනිසා උත්පත්තියේ සිට මරණය තෙක් විවිධ ක්‍රියාකාරකම් වල යෙදේ .එහිදී ළදරු වියේදී ආහාර ලෙස මව්කිරි ද ආරක්ෂාව සඳහා මව් සෙනෙහසද ඇඳුම් පැළඳුම් ලෙස ළදරු කමිස ,කලිසම් යොදා යොදාගනී ළමා වියේදී අධ්‍යාපනය සඳහා පෙර පාසල් රජයේ පාසල් වලට යොමුවේ.වැඩිවියට පත්වූ පසු තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා තමා ම නිපදවා ගන්නා අතර ඇතමුන් වෙළඳපොළ සඳහා ද නිපදවයි.

01. ඉහත සිද්ධියේ දක්නට ඇති අවශ්‍යතා දෙකක් වනුයේ,

i ආහාර, ආරක්ෂාවව

ii ආහාර ,කමිස

iii අධ්‍යාපනය ,රැකියාව

iv ආරක්ෂාව, සෙනෙහස

02. මිනිසාගේ අවශ්‍යතා හා උවමනා වෙන් වෙන්ව හඳුනාගත හැකිය. මිනිස් වුවමනා පමණක් අන්තර්ගත කාණ්ඩය වනුයේ,

i ආහාර ,බත් ,ජලය, නිවාස

ii ඇඳුම් ,වාසස්ථාන , ප්‍රවාහනය, අධ්‍යාපනය

iii සාරි, මහල් ,නිවාස, බස් ,අධ්‍යාපනය

iv බත් ,පෞද්ගලික පන්ති, නිල ඇඳුම් ,පොලිසිය

03.පහත දැක්වෙන ්‍යාපාර කටයුතු කටයුතුවලින් භාණ්ඩ නිෂ්පාදන අංශයට අයත් ්‍යාපාර කටයුතු දැක්වෙන පිළිතුර තෝරන්න

i ගෘහ කර්මාන්ත හා සිල්ලර වෙළඳාම් ය

ii මෝටර් රථ කර්මාන්තය හා රක්ෂණය

iii බැංකු හා රූපලාවන්‍ය ආයතන

iv ජංගම දුරකථන හා විදුලි උදුන් කර්මාන්තශාලා

04.ව්‍යාපාර කටයුතු මෙහෙයවමින්, ව්‍යාපාරය සම්බන්ධ තීරණ ක්‍රියාත්මක කරමින් ,කටයුතු කරන ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව වන්නේ,

i සේවකයෝ

ii කළමනාකරුවෝ

iii සැපයුම්කරුවෝ

iv ගනුදෙනුකරුවෝ

05. අනාගත ආයෝජකයන් ව්‍යාපාර පිළිබඳ උනන්දුවක් දැක්වීමට හේතුවක් වනුයේ,

i ප්‍රමාණවත් ලාභයක් ලැබීමට

ii ආයෝජනයේ සුරක්ෂිතතාවය

iii ආයෝජන පිළිබඳ තීරණ ගැනීමට

iv ව්යාපාරයේ අනාගත වර්ධනයට

06. නිෂ්පාදනයේදී ආධාර කර කරගන්නා මිනිසා විසිනි සකස් කරන ලද දේ හඳුන්වනු ලබන්නේ,

i ව්‍යවසාය

ii ප්‍රාග්ධනය

iii මානසික ශ්‍රමය

iv කායික ශ්‍රමය

07. ව්‍යාපාරයක් යනු,

i භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීමේ ක්‍රියාවලියයි

ii මිනිස් අවශ්‍යතා හා උවමනා ඉටුකිරීමේ ඕනෑම ආර්ථික කටයුත්තකි

iii ලාභ ලැබීමේ අරමුණින් කරනු ලබන ඕනෑම කටයුත්තකි

iv වෙළඳාම පිළිබඳ පුද්ගලයන් අතර ඇති කරගන්නා ගිවිසුමකි

08. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යනය කිරීම තුළින් හඳුනාගත් හැකි අවස්ථාවක් හා තර්ජනයක් පිළිවෙලින්

i	තීරණ ගැනීමේ දුර්වලතා - අන්තර් ජාතික බලවේග

ii	නිවැරදි නායකත්වය - හිතකර ආර්ථික ප්‍රතිපත්ති

iii	පාරිභෝගික ජීවන රටාව වෙනස් වීම - ාාපාර හූ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම

iv	රජය විසින් ලබා දෙන්න අඩු පොලී ණය ක්‍රම - ස්වාභාවික විපත්

09. ව්‍යාපාරයක අයිතිකරු ාාපාර කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධිය නිමකිම කිරීම ඔහුගේ ව්‍යාපාරයට,

i	ශක්තියකි

ii	දුර්වලතාවයකි

iii	අවස්ථාවකි

iv	තර්ජනයකි

10.පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සම්බන්ධයෙන් කියවෙන පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ

i	අවශ්‍යතා සංකීර්ණ වන අතර වුවමනා සරල වේ

ii	අවශ්‍යතා ව්‍යාපාරිකයාට නිර්මාණය කළ නොහැකි නමුත් වුවමනා නිර්මාණය කළ හැකිය

iii	අවශ්‍යතා අසීමිත වන අතර වුවමනා සීමිත වේ

iv	අවශ්‍යතා විවිධ වුවද වුවමනා පොදුවේ

**<u>පිළිතුරු</u>**

| | |
|---|---|
| 01 | i |
| 02 | iv |
| 03 | iv |
| 04 | ii |
| 05 | iii |
| 06 | ii |
| 07 | ii |
| 08 | iv |
| 09 | i |
| 10 | ii |